# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2076/38 – 2018 ජුනි 22 වැනි සිකුරාදා – 2018.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 126 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/ඩබ්එස්/10.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඒආර්ජ්/එල්ඒඑන්ඩී5/
ඒසීකිව්යූඅයි/බීජ්එන්ජ්ජ්/ඩබ්ලිව්/එල්අයිඑන්ර්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජුනි මස 20 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේස්වරම් පත්තුව පත්තුවේ, කුම්බුටුකුලිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පු/ඒආර්සී/2017/161 හා 2017.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.**– ආසියානු සංවර්ධන බැංකු V ව්‍යාපෘතිය යටතේ බංගදෙණිය ජල රැඳවුම් තටාකයේ අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා නල පද්ධතියක් එළීමට ඉඩම් කොටසක පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'අ' – කුම්බුටුකුලියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0042 ක් පමණ**

උතුරට: කුම්බුටුකුලියවත්ත, මාර්ගය සහ එම්. එම්. ජී. හයසින්තා කොස්තා හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත; නැගෙනහිරට: එම්. එම්. ජී. හයසින්තා කොස්තා හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත සහ කැබලි අක්ෂර ආ; දකුණට: කැබලි අක්ෂර ආ සහ චන්ද්‍රසිරි මායාකඩුව හිමිකම් කියන කුම්බුටු-කුලියවත්ත; බටහිරට: චන්ද්‍රසිරි මායාකඩුව හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත සහ කුම්බුටුකුලියවත්ත.

02. **කැබලි අක්ෂර 'ආ' – කුම්බුටුකුලියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0078 ක් පමණ**

උතුරට: චන්ද්‍රසිරි මායාකඩුව හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත, කැබලි අක්ෂර අ සහ එම්. එම්. ජී. හයසින්තා කොස්තා හිමිකම් කියන




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කුම්බුටුකුලියවත්ත; නැගෙනහිරට: ජේ. ඒ. ඩී. ෂෙල්ටන් අප්පුහාමි හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත; දකුණට: ජේ. ඒ. ඩී. ෂෙල්ටන් අප්පුහාමි හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය, ජේ. ඒ. ඩී. ෂෙල්ටන් අප්පුහාමි හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත සහ චන්ද්‍රසිරි මායාකඩුව හිමිකම් කියන කුම්බුටුකුලියවත්ත.

07 – 203

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 125 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2014/ඩබ්ලිව්එස්/227.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එන්වයිජීඑම්/එල්ඒඑන්/7/50.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූනි මස 20 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, නියාගම.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුර පිටිපන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක ජීඒ/එන්වයිජී/2017/903 හා 2017.10.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0102 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගල්ගහඕවිට – ප්‍රමාණය: හෙක්. 0.0102 ක් පමණ**
උතුරට: ඩබ්ලිව්. ඩී. එම්. ප්‍රදීප් හිමිකම් කියන ගල්ගහඕවිට; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ ඩබ්ලිව්. ඩී. එම්. ප්‍රදීප් හිමිකම් කියන ගල්ගහඕවිට; දකුණට සහ බටහිරට: ඩබ්ලිව්. ඩී. එම්. ප්‍රදීප් හිමිකම් කියන ගල්ගහඕවිට.

07 – 204

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 127 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/504.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/6/2017/ජලසම්/01/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූනි මස 20 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, පොල්ගහවෙල.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙනිහත්පත්තුව සුළු කොට්ඨාසයේ අංක 993, සෙරපිස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සෙරපිස්වත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේශ්‍ය/පීඑල්ජී/2018/01 හා 2018.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සෙරපිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 2.5721 ක් පමණ**
උතුරට: දුම්රිය මාර්ග රක්ෂිතය; නැගෙනහිරට: දුම්රිය මාර්ග රක්ෂිතය සහ ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; දකුණට: කැබලි අක්ෂර බී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත සහ ආයෝජන මණ්ඩලය හිමිකම් කියන ඉඩම; බටහිරට: ආයෝජන මණ්ඩලය හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – සෙරපිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0448 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; නැගෙනහිරට: ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; දකුණට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත.

07 – 205

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ අංකය: 03ජේ/91/එල්ආර්බී/219.
ඉඩම් අත්කරගැනීමේ නිලධාරිගේ යොමු අංකය:
ජීසීඑෆ්/ඒටීඑච්/එන්ජී/24/එල්ආර්.

අංක 2059/21 හා 2018.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ පළකරන ලද ශුද්ධි පත්‍රිකාවේ මාතෘකාව ''38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව හා 1992 අංක 12 දරන ආඥාව'' යන්න ''39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය'' ලෙසත් ''1992 අංක 12 දරන ආඥාවට අතුරුවිධාන අදාළ අවසතු කිරීමේ නියමය'' යන්න ''1992 අංක 12 දරන අතුරුවිධාන ආඥාවට අදාළ අවසතු කිරීමේ නියමය'' ලෙසත් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජුනි මස 20 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.